බන්දු මනම්පේරිගේ කලාව

බන්දු මනම්පේරිගේ මුල්ම සහ ප්‍රබල කලාත්මක එළඹීම Made in IAS ප්‍රදර්ශනයත් සමග සමාජාවතීර්ණ විය. ඒ ඔහුගේ "*ක්ෂණික නිර්වාණ පුද්ගලික සමාගම* " නම් කෘති පෙළත් සමගයි. එමෙන්ම බන්දු මුල් වරට දේශීයව සහ විදේශීව අවධානයට පාත්‍ර වූයේ ද මේ ප්‍රදර්ශනයත් සමගය. ජගත් වීරසිංහගේ අභිරක්ෂණ මැදිහත් වීම මත සංවිධානය වූ Made in IAS ප්‍රදර්ශනය 90වේ ප්‍රවණතාවේ කලාව පිළිබද විශ්වාස, භාවිත සහ ක්‍රියාත්මක වීම් පිළිබඳ කතිකාවේ නිෂ්පාදනයකි.

Made in IAS ප්‍රදර්ශනයෙන් අනතුරුව බන්දුගේ බොහෝ දෘෂ්‍ය කලා අවතීර්ණ වීම් සිදු වූයේ නිරූපන කලා ශිල්පියෙකු ලෙසය. නිරූපණ කලාව 90 ප්‍රවණතාවයේ හඳුන්වාදීමකි. බන්දු මනම්පේරි එහි නිරූපණ ශිල්පීන් තිදෙනාගෙන් එක් අයෙකි. බන්දු මනම්පේරි නිරූපණ කලා ශිල්පියෙකු ලෙස, එක් අතකින් පුරුෂ මූලික සමාජයක අවිච්චින්නව පැවතෙමින් තිබෙන ස්ත්‍රිය මත පටවා ඇති පීඩාකාරී සංස්කෘතික විශ්වාස හෝ භාවිත මිනිස් පදනමක සිට විචාරයට ලක් කළ අතර අනෙක් අතින් යුදමය සමාජයක තනි පුද්ගලයාගේ වේදනාව හෝ එහි අති විශාල පීඩනය පිළිබදව සංවේදී වූ නිරූපණ එළි දැක්වීය. එමෙන්ම ආන්තික ආගමික මැදිහත් වීම් සහ පූර්ණ වශයෙන් ආන්තික රාජ්‍ය හැසිරීම් පිළිබදව විටෙක වඩාත් දේශපාලනිකව ද සහ තවත් විටෙක හාස්‍යයෝත්පාදකව ද විචාරශීලී වීම් බන්දුගේ නිරූපණාංග වෙතින් නිරීන්ෂණය කළ හැකිය.

මෙවර බන්දු මනම්පේරි තීර්ථ " Red Dot " කලාගාරයේ පවත්වන දෘෂ්‍ය කලා ප්‍රදර්ශණය වෙතින් වඩා සියුම් සමාජ දේශපාලනික ස්වරූපණයක් ස්පර්ශ කරයි. ඊට බන්දු යෝජනා කරන දෘෂ්‍ය රූපක ඒවායෙහි මූලික පෙනුමෙන්ම තුන් ආකාර වේ. එනම් ඔහුගේම ශරීරයෙන් ගත් අච්චුවක් අනුසාරයෙන් තනන ලද ක්ෂණිකව ගල් ගැසුනු ස්වභාවයක් පෙන්වන රූපය පළමු ආකාරය වේ. එම රූප විවිධ මතු පිට ආවරණ වලින් ආවරණය කර පොලොවෙන් මදක් උසින් එල්ලා ඇත. දෙවැනි යෝජනාත්මක රූපය වන්නේ මුල් අච්චුවෙන් ගත් මුල් ස්වරූපය තරමම තොරතුරු නැති වඩා නම්‍යශීලී රූපකයෙකි. එය මූලිකව ඔහුගේම මුල් චර්මය (සම) වැනිය. එනම් මුල් සමට විවිධ මතුපිට ආවරණ දමා ගැනීමට පෙර ස්වභාවය යැයි යෝජනා කිරීමට පුළුවන. එය කලාගාර අවකාශයෙහි වැතුරුණු ස්වභාවයක් සහිතව ඉදිරිපත්කර ඇත. තුන්වැන්න ඔහුගේම නිරූපණ අංගය ය.

මෙමගින් බන්දු උත්සාහ ගන්නේ සමාජයේ පුද්ගලයා දේශපාලනික වශයෙන් සිය ස්වභාවික වැස්මට (චර්මය, සම) අමතරව විවිධ වූ සංස්කෘතික දේශපාලනික ආවර්ණ, ආරක්ෂණ පටල වෙතට අවතීර්ණ වන බවත් ඒ තුළ සුරක්ෂිත වන බවත්ය. එම තත්ව විටෙක අදාල දේශපාලනික සංස්කෘතියට සාපේක්ෂව හෝ ඊට අනුසාංගිකව ආගමිකවාදී, ඓතිහාසික හෝ අතීතකාමී, පරිසරකාමී, ස්වදේශකාමී, ස්වකාමී, නිදහස්කාමී, මාධ්‍යප්‍රේමී හෝ ජාතිවාදී වේ යැයි බන්දු මේ මගින් කියා සිටී. මෙන්න මේ සමාජයීය හෝ පුද්ගල මනෝභාවය, සංකීර්ණ දේශපාලනික සංස්කෘතික සහ ආගමික මොහොතක් විසින් හෝ එම මොහොතේ දේශපාලනික කතිකාව විසින් එකිනෙකාගේ ස්වාධීනත්වය, දෘෂ්ටිවාද අහුරා ඇති බවත් එම සියළු සමාජ ප්‍රවාහ මේ මොහොතේ බලවත් දේශපාලනික කතිකාවට නතු වී ඇති බව බන්දු මෙයින් යෝජනා කරන බවක් නිරීක්ෂණය කළ හැකිය. බන්දුගේ මෙම ඉදිරිපත් කිරීම් වෙතට තවදුරටත් අවතීර්ණ වුවහොත් මෙවැනි අදහසක් යෝජනා කළ හැකිය. එනම් මුල් සංස්කෘතික වැස්ම හෝ ආවරණය දේශපාලනික වශයෙන් වඩා අහිංසක බවත් නව ආරක්ෂණ වැස්ම වඩාත් දේශපාලනික බවත්, ඒවා එතරම් අහිංසක නොවන බවත්ය. එමෙන්ම මේ සියුම් දේශපාලනික මොහොතෙහි ඒ සියලු සමාජ ප්‍රපංච නිරුත්තර හෝ වගකීමෙන් නිදහස් අජීවී සැහැල්ලුවක් විඳිමින් සිටින වගක් බන්දු ප්‍රකාශ කර සිටී. වෙනත් ආකාරයකින් කියනවානම් සියලු සමාජ ප්‍රපංච නිරපේක්ෂ රාජ්‍ය මතවාදී කතිකාවේ ( total state ideological discourse ) පොදු ගුණාකාරයට නතුව ඇතැයි බන්දු යෝජනා කරයි.

එමෙන්ම බන්දුගේ මෙම ප්‍රදර්ශනය ඔහුගේ මුල් වැඩ හා ඍජු සම්බන්ධයක් ද පෙන්නුම් කරයි. එනම් මූලිකව නිරූපන ශිල්පියෙකු ලෙස පෙනී සිටින ඔහු මෙහිදී ඔහුගේ ප්‍රධානම කලාත්මක හැඩය ලෙසට ඔහුගේම ශරීරය යොදා ගැනීම සහ කලාත්මක හැඩයේ මතුපිට විවිද වයනයන් ( textures ) ගොඩනැගීමයි. බන්දු මෙම ප්‍රදර්ශනයේදී මෙම තත්ව දෙකම වඩා සියුම් ලෙස යොදාගන්මින් එක් ප්‍රධාන අරමුණක් වෙතට නාභිගතකර ඇත.

සමස්ථයක් ලෙසට බන්දුගේ දෘෂ්‍ය ඉදිරිපත් කිරීම හෝ දෘෂ්‍ය යෝජනාව දේශපාලනික සංස්කෘතික බල ක්‍රියාවලිය හා බැදුනු සංකීර්ණ රාජ්‍ය යාන්ත්‍රණ සූක්ෂමතා ඍජු අවධාරණයකින් තොරව මුදාහරින්නට ගන්න උත්සාහයක් ලෙසට යෝජනා කළ හැකිය.

ප්‍රසන්න රණබාහු (13/10/2009)